# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014.06.26

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයː**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීමː

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

1. නගර සභා ගරු සභාපති නිමල් ගාමිණි වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

මෙවර පළාත් පාලන සතියේ දී අදාළ මෙවලමට අනුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ බව ද සියළුම රාජ්‍ය ආයතන එක් රැස් කර ගනිමින් ක්‍රීඩා සඳහා වෙන් කළ දින 03 දී නෙට්බෝල්, වොලිබෝල් හා ක්‍රිකට් තරග පැවැත්වූ බවද පැවති තරග වලදී ක්‍රිකට් ශූරතාවය ද, නෙට්බෝල් හා වොලිබෝල් පිරිමි අනුශූරතාවය ද නගර සභාව විසින් දිනාගත් බවද, සේවයේ යෙදෙන අතරතුර නගර සභාවේ අනන්‍යතාවය රැකගැනීම සඳහා ඉදිරිපත් වීම වෙනුවෙන් හා සහයෝගය දැක්වීම වෙනුවෙන් සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පළ කරන බවද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම උප සභාපතිතුමන් ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට ද දැක්වූ සහයෝගය වෙනුවෙන් එතුමන්ගේ ස්තුතිය පළ කරන ලදි.

එසේම කාර්ය සාධන තරගයේ 2012 - පළාත් මට්ටමේ දී ප්‍රථම ස්ථානය නගර සභාව විසින් දිනා ඇති අතර 27 වන දින ජාතික මට්ටමෙන් තරග විනිශ්චය සඳහා පැමිණෙන බවත් මෙයට පෙර 03 වන ස්ථානය එක් වරක් ද 02 වන ස්ථානය දෙවරක් ද දිනා ඇති නගර සභාව මෙවර මෙවලම අනුව ක්‍රියාකර ඇති බැවින් ප්‍රථම ස්ථානය ලබා ගැනීමේ බලාපොරොත්තුවක් පවතින බව ද ඉදිරියේ දී ඵලදායිතා තරගාවලිය වෙනුවෙන් තරග විනිශ්චය සඳහා පැමිණෙන බවද එයින් ද ජයග්‍රහණයක් බලාපොරොත්තු වන බව ද කාර්ය මණ්ඩලය සමග ධෛර්යමත්ව මහින්ද චින්තන ඉදිරි දැකම අනුව අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන රාජ්‍ය සේවය ජනතාවට දැනෙන ආකාරයට ගෙන යාමට හා ජනතාවගෙන් ලැබෙන බදු මුදලින් හා අනෙක් මුදල් ප්‍රතිපාදන එක් කර ගනිමින් ජනතාවට සේවය කිරීම සඳහා කටයුතු කරන ලෙස ද එතුමන් විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදි.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය සභා වාරයේ දී කාර්පාක් කඩ කාමර අංක 06, වසර ගණනාවක සිට පවත්වා ගෙන යන එම්. එල්. ආනන්ද හා කමලාවතී මැණිකේ යන අය රු. 6500.00 බැගින් ලබා ගැනීමට කැමැත්ත පල කර තිබූ බැවින් ඔවුන්ට එය ලබා දීම සුදුසු බවට යෝජනා ස්ථිර වුවත් පසුව සිදුකළ සොයා බැලීම් වලදී එය ටෙන්ඩර් කළ කඩ කාමරයක් බවත්, ඉහත පුද්ගලයන්ට එය දීමට හැකියාවක් නොමැති බවත් ඔවුන් ගිවිසුම් නීති උල්ලංඝනය කර ඇති බැවින් ටෙන්ඩර් කිරීමේදී නැවත ඔවුන්ටම එය ලබා දිය නොහැකි බවත් ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි. ඉහත පුද්ගලයන් ආර්ථික වශයෙන් ඉතා අපහසුතා මැද ජීවත් වන හෙයින් ඔවුන්ට මෙම කඩ කාමරය ලබා දීම සුදුසු බවට අදහස් පළ වූ නමුත්, සානුකම්පිතව සලකා බලා හෝ එය ලබාදිය නොහැකි බවත් නැවත එම කඩ කාමර ටෙන්ඩර් කළ යුතු බවත්, මෙයට පෙර එම කඩ කාමර ලබාගත් අයගේ තැන්පත් මුදලින් හිඟ මුදල් අයකර ගන්නා ලද බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එසේම තවත් මාර්ග කීපයක් ඉදිරියේ දී සංවර්ධනය කිරීමට බලාපොරොත්තු බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

එසේම පසුගිය සභාවරයේ දී 6:6 යටතේ සාකච්ඡා කරන ලද යශෝධා හාඩ්වෙයාර් ඉදිරිපිට කහඉර ඉවත් කිරීම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමන් විසින් හේතු විමසන ලද අතර එම මාර්ගයේ දෙපසම කහ ඉර ඇති බැවින් වාහන නවතා තැබීමට නොහැකි බව ද ඒ නිසාම ව්‍යාපාරික ප්‍රජාව අපහසුතාවයට පත්ව ඇති බවද ඉහත හේතු නිසා මාර්ගයේ එක් පසෙක කහඉර ඉවත් කිරීමට යෝජනා සම්මත වූ බවද ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන මෙහෙයවනු ලබන Auto cad මෘදුකාංගය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමට පාඨමාලා ගාස්තු ඉල්ලීම

පළාත් පාලන ආයතන වල තාක්ෂණ නිලධාරීන් සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන මෙහෙයවනු ලබන Auto cad මෘදුකාංගය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමට පාඨමාලා ගාස්තු රු. 15000 ක් ඉල්ලීම සඳහා යොමුකර තිබූ ලිපිය පිළිබඳ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 බළන්ගොඩ, කාර් පාක්, විවෘත කඩ අංක 06 කඩ කාමරය බදු දීම

මෙම කඩ කාමරය මීට පෙර අවස්ථා දෙකකදී බදුගත් අය ටෙන්ඩර් ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීම නිසා අසාදු ලේඛනගත වී ඇති බැවින්, නැවත ඔවුන්ට ලබාදිය නොහැකි බව ද, එම නිසා නැවත ටෙන්ඩර් කිරීම සඳහා තීරණයක් ගැනීම සඳහා විෂය භාර නිලධාරී විසින් යොමු කර තිබූ ලිපියට අනුව මීට පෙර අවස්ථාවකදී ටෙන්ඩර් කිරීම සඳහා භාෂා දෙකකින් පුවත්පත් දැන්වීම් පළ කිරීමට විශාල මුදලක් වැය වූවත් කිසිවෙක් ටෙන්ඩර් ගැනීමට ඉදිරිපත් නොවීම නිසා ප්‍රසිද්ධ දැන්වීමකින් එය නැවත ටෙන්ඩර කිරීම සඳහා ද ඒ සඳහා මිල ගණන් රු. 9750'00 ක අවම ලංසුව යටතේ නැවත ටෙන්ඩර් කැඳවීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඉදිරිපත් වූවත් ඒ සඳහා මහා සභාවේ එකඟතාවය පළ කරන ලදි.

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*තමන් ගන්නා තීන්දු තීරණ ජනතාවගේ යහපත සඳහා වැදගත් බවත්, ඔවුන් වෙනුවෙන් තීරණ ගැනීමේ බලධරයන් ලෙස මහා සභාවේ රැස් වන බවත්, තමන් ගන්නා තීන්දු තීරණ නගරය පාලනයේ දී නීතියක් වන අතර ඒවා වැදගත් බවත්, එම තීන්දු තීරණ ගැනීමේ දී මෙයට වසර කීපයකට පෙර මාසික මහා සභාවකදී තීරණය කර ගත් පරිදි සියලුම අංශ ප්‍රධානීන් ගරු සභාවේ අවශ්‍යතාවයක් ඇතිවුවහොත් මෙම ගරු සභාවට වාර්තා කිරීමට කාර්යාල පරිශ්‍රය තුළ රැඳී සිටිය යුතු බවත්, නැවත ගරු සභාව දිනට න්‍යාය පත්‍රයට අනුව සැලකිය යුතු ගැටළු ඇත්නම් සාකච්ඡා කර ගැනීමට අදාළ අංශ ප්‍රධානියා දැනුවත් කරන ලෙස නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි. එසේ නොවුවහොත් දේශපාලනඥයන් ලෙස තමන් අවතක්සේරුවට ලක්වන බවද ඉදිරියේදී මෙම ගැටළු අවම වන ලෙස අංශ ප්‍රධානීන් දැනුවත් කරන ලෙස එතුමන් විසින් වැඩිදුරටත් දන්වන ලදි.*

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා***

*මෙම ගැටළුවේ දී සානුකම්පිතව සලකා බැලීමක් සිදුකළ බවත් නගර සභාවේ නීති රීති පද්ධතිය අනුව කටයුතු කරන බවත් ගරු සභාපතිතුමන් විසින් දන්වා සිටින ලදි.*

**06:03 බළන්ගොඩ, නව බස්නැවතුම් පොළ සී - 19 කඩ කාමරය පවරා දීම - බී. කේ. ජිනදාස**

බළන්ගොඩ නව බස්නැවතුම් පොළ සී - 19 කඩ කාමරය පවරා දීම තම දියණිය වන උදේනි ශ්‍රියාලතා ජිනදාස යන අයට පවරා දෙන ලෙස බී. කේ. ජිනදාස මහතා කර තිබූ ඉල්ලීම අනුව අය කර ගත යුතු මුදල් ටෙන්ඩර් පටිපාටියට අදාළ කොන්දේසි අනුව අය කර ගෙන පවරා දීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 බළන්ගොඩ, රාස්සගල පාර, අංක 38බී ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු සහනයක් ලබා ගැනීම - එම්. එස්. එච්. අමීර්**

බළන්ගොඩ, රාස්සගල පාර, අංක 38බී ගොඩනැගිල්ල පදිංචිය අතහැර දමා ඇති බැවින් 2014 වර්ෂයේ සිට වරිපනම් බදු සහනයක් ලබා ගැනීමට එම්. එස්. එච්. අමීර් මහතා විසින් යොමු කර තිබූ ලිපියට අනුව වරිපනම් බදු මුදලෙන් අඩක් නිදහස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 ශ්‍රී දළදාගමනය චිත්‍රපටය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලීම**

ශ්‍රී දළදාගමනය චිත්‍රපටය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස බළන්ගොඩ විභාවී ජ්‍යොතිර් විද්‍යාභිවර්ධන සංගමය කර තිබූ ඉල්ලීම සහ ඉහත කරුණ සම්බන්ධයෙන් සබරගමු පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්ගේ CLG 8501 සහ 2014-06-25 දිනැති ලිපියට අනුව 10% ක් විනෝද බදු ලෙස අය කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 සුළඟ නිසා කැඩී ගිය වහලය සඳහා ඇස්බැස්ටස් තහඩු 04 ක් ඉල්ලා සිටීම - ඩී. සිරිමා චන්ද්‍රවතී මහත්මිය**

පසුගිය දිනවල පැවති තද සුළඟ නිසා කැඩී ගිය වහලය සඳහා ඇස්බැස්ටස් තහඩු 04 ක් ඉල්ලා ඩී. සිරිමා චන්ද්‍රවතී මහත්මිය යොමු කළ ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවර සභාවාරය සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර සභාවාරය සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

11:01:01 බළන්ගොඩ, කාර් පාර්ක්, විවෘත කඩ අංක 06 කඩ කාමරය සඳහා ගරු සභාවෙන් ගත් තීරණය වැරදි බව නිලධාරීන් පවසන බැවින් එය නිවැරදි කිරීමට යෝජනා කිරීම

ඉහත 06:02 යටතේ සාකච්ඡා කරනු ලැබීය.

11:01:02 එක් ගමකට එක් වැඩක් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියෙන් එක් වැඩක් පමණක් ගරු සභාවට ලබාගැනීම සඳහා විරෝධය ඉදිරිපත් කිරීම

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් කරුණු එහිදී මතුවිය.

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*එක් ගමකට එක් වැඩක් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති ගරු සභාපතිතුමන් විසින් නඩත්තු කටයුතු නිසා නගර සභාවෙන් ක්‍රියාත්මක කළ නොහැකි බව දැන්වූවත්, ව්‍යාපෘතියට 20% ක ප්‍රජා දායකත්වය නොමැති නිසා මෙය නගර සභාවෙන් කළ හැකි බවත් ගරු සභාපතිතුමාගේ ව්‍යාපෘතිය නගර සභාවෙන් සිදු කරන අතර අනෙක් මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කරන බවත් ඒ වෙනුවෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, ප්‍රාදේශීය ලේකම්*

*කාර්යාලයේ එක් තාක්‍ෂණික නිලධාරියෙක් ව්‍යාපෘති 300 ක් අධීක්‍ෂණය කරන අතර ඉහත ව්‍යාපෘතිය නගර සභාවේ තාක්‍ෂණික නිලධාරී හා වැඩ අධිකාරී යන නිලධාරීන් දෙදෙනා හරහා සිදුකර ගත හැකි බවත් ඒ සඳහා අවශ්‍ය වෙනත් සම්පත් ද නගර සභාවේ ඇති බවත් ප්‍රකාශ කර සිටින ලදි.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*ඉහත ව්‍යාපෘති නගර සභාවෙන් සිදු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.*

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා***

*එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘති නගර සභාවෙන් සිදු කළහොත් 2% ක පරිපාලන වියදම් නොලැබෙන බවත්, දැනට සියලුම ව්‍යාපෘති ප්‍රාදේශය ලේකම් කාර්යාලයෙන් සිදු කරන අතර අධීක්‍ෂණ කටයුතු පමණක් නගර සභාවෙන් සිදු කරන බවත්, නමුත් මෙයට පෙර සාකච්ඡා වූ පරිදි මේ නිසා ගරු මන්ත්‍රීවරුන්ට සිදුවන අසාධාරණය වෙනුවෙන් ගරු උපසභාපතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව අනුව එම ව්‍යාපෘති නගර සභාවට ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස වැඩ අධිකාරී දැනුවත් කරන ලෙසත්, අධීක්‍ෂණ නිලධාරී ලෙස නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් වෙත වගකීම පවරන බවත් ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදි.*

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතියේ අධීක්‍ෂණ කටයුතු සඳහා බලය පැවරීම වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තුතිය පළ කරන ලදි.*

11:01:03 කොම්පෝස්ට් ව්‍යාපෘතිය නිසා ප්‍රදේශයේ ජනතාවට ගැටළු ඇතිවී ඇති අතර එහි වර්තමාන තත්ත්වය ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කිරීම

එම යෝජනාවන් ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් කරුණු එහිදී මතුවිය.

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*මුලදී ගැටළුවක් නොමැති වූ නමුත් කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිහිටුවා ඇති බැංකියවත්ත ප්‍රදේශයේ අපද්‍රව්‍ය දිරායාමේ දී නිකුත්වන ලීචේජ් වලවේ ගඟට ගලායාම නිසා ජලය අපිරිසිදු වී එම ප්‍රදේශයේ ජනතාවගේ විරෝධයක් මතුවී ඇති බවද නයිට්සොයිල් ව්‍යාපෘතිය අක්‍රමවත් වී ඇති බවද එයට හේතු වී ඇත්තේ අධීක්‍ෂණය විධිමත් නොවීම නිසා බවද කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රමවත් කිරීමට වැඩපිළිවෙලක් නැවත සැකසිය යුතු බවද අධීක්‍ෂණය විධිමත් කළ යුතු බවද ගරු උපසභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*බළන්ගොඩ කුණු ගොඩක් යන සංකල්පය කොම්පෝස්ට් ව්‍යාපෘතිය නිසා නැතිවී ඇති බවත්, ඒ සඳහා ඇපකැප වූ සියළුම දෙනාට ස්තූතිය පළ යුතු බවත්, එම ව්‍යාපෘතිය ප්‍රතිලාභ නගරයේ හා නගරයෙන් පිට ජනතාව භුක්ති විඳින බවත් ඉතාමත් විශාල පුණ්‍යකර්මයක් බවත්, බැකිංයවත්ත ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගයද මේ සඳහා ලැබුණත්, එම ප්‍රදේශයට සම්බන්ධකම් ඇති උපසභපතිතුමන් පවසන ලෙස ගැටළු මතුවී ඇත්නම් එම ජනතාවට අසාධාරයක් වන බැවින් එය පරීක්‍ෂා කර බලා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*නගරයට විශාල කරදරයක් වූ වූ කුණුගොඩ නගරයෙන් ඉවත් කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ද හිටපු අමාත්‍ය මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාට ද ස්තූතිය හිමිවිය යුතු බවද, නයිට්සොයිල් ව්‍යාපෘතියේ ගැටළු මතුවී ඇති බවද එය යම් ප්‍රමාණයකට අසාර්ථක වී ඇති බව ද සඳහන් කළ ගරු මන්ත්‍රීතුමා බැංකියවත්ත ප්‍රදේශයේ ජීවත් වන යූ. ආර්. පියදාස මහතා එතැනට පත් කරන ලෙස ඉල්ලා සිටියේය. එවිට එය යථාතත්ත්වයට පත් කර ගත හැකි බවද අනෙක් සියළු සභාවල මූලික ගැටළුව වන මෙම ගැටළුව බළන්ගොඩ නගර සභාව විසඳාගෙන ඇති අතර එහි සිදුවූ අඩුපාඩු මගහැර ගැනීමට මහජන සෞඛ්‍ය පරීක්‍ෂක මහතාගේ ද සහයෝගය ඇතිව ක්‍රියාකළ යුතු බව ද එතුමන් විසින් වැඩිදුරටත් දන්වන ලදි.*

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා***

*බළන්ගොඩ නගරයෙන් පිට ප්‍රදේශවලට ගලි සේවය ලබාදීම නිසා දරා ගත නොහැකි තරම් ප්‍රමාණයක් ලැබීමෙන් නයිට්සොයිල් ටැංකි උතුරා යාම නිසා ලීචේඩ් ඉවතට ගලා යන බවද, වසර 7, 8 කට පෙර මෙම ටැංකි සෑදීම නිසා එහි යකඩ හා වැල් දිරා යාම හා කොහුබත් විනාශ වීම නිසා ගැටළු මතුව ඇති බවත්, එම ප්‍රදේශයේ අයෙකුට ඩෙංගු සෑදීම හා ආසන්න ප්‍රදේශයේ ඌරු කොටුව නිසා මෙම ප්‍රශ්නවල තත්ත්වය වෙනත් දිශාවක ගමන් කර එය දැඩි ගැටළුවක් බවට ප්‍රදේශයේ ජනතාව පත්කර ගෙන ඇති බවත්, එසේම මෙහි මැස්සන් අදටද නොමැති බවත්, පිට ප්‍රදේශවල විශාල පිරිසක් මෙම ව්‍යාපෘතියේ පුහුණුවීම් සිදුකරන බවද ප්‍රකාශ කර සිටින ලදි. එසේම කොම්පෝස්ට් ටොන් 05 ක ඇණවුමක් ලැබී ඇති අතර එය නිම කරමින් පවතින බවත් අක්‍රියව පවතින පොහොර හලන මැෂිම මේ වන විට යථා තත්ත්වයට පත්කර ගෙන ඇති බවත් දන්වන ලදි. නමුත් නයිට්සොයිල් ව්‍යාපෘතිය සඳහා කොහුබත් ලබාගැනීමට ලක්‍ෂ 05 ක් වැය කළ යුතු බව දැනුම් දුන් අතර දැනට පවතින නීති රීති හා ආඥා පණත්වල සියළු බලතල සමග කොම්පෝස්ට් ව්‍යාපෘතිය සෞඛ්‍ය කමිටුවේ සභාපති වන ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පවරන බව හා ඒ සඳහා වන බලතල පැවරීම හැකි විගසින් ලබා දෙන බවද ගරු සභාපතිතුමා දැනුම් දුන්නේය. එසේම එතුමන් විසින් එහි අවශ්‍ය වෙනස් කම් සිදුකර එහි වගකීම ගන්නා ලෙසද අවශ්‍ය ප්‍රතිපාදන සලසන බවද ප්‍රකාශ කරන ලදි.*

11:01:04 එක් ගමකට එක් වැඩක් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් නිසා ප්‍රාදේශීය මට්ටමේ මන්ත්‍රීවරුන්ට ඇතිව ඇති ගැටළු හා ප්‍රශ්න ගරු සභාවට යෝජනා කිරීම

එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් කරුණු එහිදී මතුවිය.

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*එක් ගමකට එක් වැඩක් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් නිසා ප්‍රාදේශීය මට්ටමේ මන්ත්‍රීවරුන්ට ඇතිව ඇති ගැටළු හා ප්‍රශ්න මතුවී ඇති බවද එම ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු කර ගැනීමට යාමෙන් මන්ත්‍රීවරුන්ට නිලධාරීන් පස්සෙන් යාමට සිදුව ඇති බව හා මේ කාරණය නිසා මන්ත්‍රීවරුන් පාච්චල්වී හා අසරණ වීම සිදුවන බවද එතුමා පෙන්වා දුන්නේය. එසේම නගර සභාවෙන් මෙම ව්‍යාපෘති සිදු කිරීමෙන් කාර්යක්‍ෂමතාවය ඇතිවීම හා ප්‍රදේශයේ ජනතාව සතුටු වන බවද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.*

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබී ඇති ව්‍යාපෘති කාර්යක්‍ෂමව සිදු නොවන බවත් නගර සභාවෙන් සිදු කළානම් කාලය, ශ්‍රමය ඉතිරි වන බවත්, මන්ත්‍රීවරුන්ට නිලධාරීන් නිසා රස්තියාදුවීමට සිදුව ඇති බවත් දැනට ආරම්භ කළ ව්‍යාපෘති ඔවුන්ට නිම කිරීමට ලබා දී නව ව්‍යාපෘති නගර සභාව මගින් සිදු කිරීම වඩා ඵලදායී බවත් නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.*

11:01:05 ජිනීවා සමළුවේ දී ගෙන ඇති යෝජනා සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් විරුද්ධත්වය ප්‍රකාශ කිරීම හා මානව හිමිකම් හා යුධ අපරාධ පිළිබඳ සෙවීමට ලංකාවට ඒමට විරුද්ධත්වය ගරු සභාව තුළ යෝජනා ස්ථිර කර ගැනීම

එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව අදහස් තිබේ දැයි විමසන ලද අතර පහත සඳහන් අදහස් එහිදී පළවිය.

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*ලංකාවේ පසුගිය වසර වල සිදු වූ අපරාධ අති විශාල බවත්, නමුත් ලංකාවේ සිදු වූ එවැනි අපරාධ මිනී මැරුම් සඳහා මානව හිමිකම් ආයතන කිසිදු පියවරක්*

*නොගත් නමුත් ආසියාවේ හොඳම නායකත්වය හා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට පත් වූ පසු තිස් වසරක යුද්ධය නිම කර නිදහස් ලංකාවක් ගොඩනැගූ අතර, යුද්ධයේ අවසාන සති දෙක පමණක් අළලා මානව හිමිකම් චෝදනාවක් එල්ල වී ඇති බවත්, එය අසාධාරණ ක්‍රියාවක් බවත්, ලෝකයේ බොහෝ රටවල පිනීවා නිසා ගැටළු බොහෝ වැඩි වී ඇති බවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලෝකයේ කිසිම රටක සාමයක් ඇති නොකළ බවත්, ජාතින් අතර අසමගිය වර්ධනය කරන බවටත් ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් චෝදනා එල්ල කරන ලදි. ලංකාව යනු සියළුම ජාතීන්ට, ආගමිකයන්ට සුහදව සහයෝගයෙන් ජීවත් විය හැකි රටක් බවත්, එය විනාශ කිරීමට ඉඩ නොදී එක්සත් ජාතීන්ගේ පිනීවා යෝජනාව පරාජය කිරීමට සහ මෙම ගරු සභාවේ එකමුතුව පෙන්වීම සඳහාත් මෙම යෝජනාවට සහයෝගය ලබා දෙන ලෙස එතුමන් විසින් ඉල්ලා සිටින ලදි.*

**නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

*ලංකාවේ වසර 30ක කාලය තුළ රටේ විවිධ ගැටළු මතුවූ බවත් දේශපාලන නායකයන්, ආගමික නායකයන්, බුද්ධිමතුන් ද තරාතිරමක් වයස් භේදයක් නොහැතිව විශාල ලෙස පිරිස් ඝාතනයට ලක් වූ බවත්, එවැනි අවස්ථාවල මානව හිමිකම් පිළිබඳ සොයා නොබැලූ පිරිස් ලංකාවේ ප්‍රතිරූපය විනාශ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා විවිධ ක්‍රියාමාර්ග ගන්නා බවත්, පිනීවා යෝජනා එහි ප්‍රතිඵලයක් බවත්, යුධ අපරාධ චෝදනා ගෙනවිත් ලංකාවේ ජාතීන් අතර අසමගිය ඇති කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කළේය.*

*මේ වන විට ලංකාව සමගිය සංවර්ධනය ඉලක්ක වූ ගමනක් යන අතර රටේ සංහිඳියාව විනාශ කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය කටයුතු කරන බවත්, එම සංවිධානය කිසිදු රටක සාමයක් ඇති නොකළ බවත්, එබැවින් පිනීවා යෝජනා වලට එරෙහි ව ගෙන ආ යෝජනාවට සහයෝගය පළ කරන බවත් නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින ලදි.*

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා**

*අප රටට විරුද්ධව පිනිවාහි සම්මත කර ගෙන ඇති මානව හිමිකම් කඩවීම් සම්බන්ධව කථා කිරීමේදී ඇමරිකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නායකත්වය හොඹවන බවත්, රටවල අභ්‍යන්තර සාමය අවුල් කර තම රටේ නිෂ්පාදිත ආයුධ විකිණීමේ ව්‍යාපාරය දියුණු කර ගැනීමට හා රටේ ජනාධිපති ලෙස ඇමරිකා ජනාධිපතිට ඇති ජනප්‍රියත්වය අඩුවන කාලයට අනෙක් රටවල් ආක්‍රමණය කිරීමට ඔවුන් කටයුතු කරන බවත් සඳහන් කළ නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා ලෝකයේ ප්‍රථම වරට යුද්ධය නිමකළ අතිගරු ජනාධිපතිතුමාගේ කීර්ති නාමය ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවලට දරාගත නොහැකි නිසා මෙලෙස චෝදනා එල්ල කරන බවත් ඒ සඳහා විරුද්ධත්වය පළ කිරීමට හා රටට ඇති පක්ෂපාතීත්වය පෙන්වීමට පිනීවා යෝජනා සඳහා උප සභාපතිතුමන් විසින් ගෙන ආ යෝජනාවට සහයෝගය පළ කරන බවත් ප්‍රකාශ කරන ලදි.*

**නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා**

*ගරු උපසභාපතිතුමා ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන අතර රටේ සාමයක් පවතින මෙම අවස්ථාවේ යුද්ධය නිමා කර නිදහස ලබා දුන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ශක්තියක් වීම සඳහා කටයුතු කරන බව දන්වා සිටින ලදි.*

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

*මෙම යෝජනාව සම්බන්ධයෙන් විපක්ෂ නායකත්වය පාර්ලිමේන්තුවේදී තීරණයක් ගෙන ඇති බවද රටේ ජනතාවට ගෙන ආ විරෝදයක් නොවන නිසා හා රජයට පමණක් ගෙන ආ යෝජනාවක් නිසා ඉහත යෝජනාවට විරුද්ධ වන බවද, 60 දශකයේ ගත් තීන්දු තීරණ නිසා දෙමළ සිංහල කෝලාහල වල මූලාරම්භය සිදුවූ බවද එම මූලබීජ වල ඵල 80 දශකය වන විට වර්ධනය වූ බවද අද ගන්නා දේශපාලන තීරණ වල ප්‍රතිඵලද අනාගතයේදී වසර ගණනකින් අත් විඳීමට සිදුවන බවද සඳහන් කළ ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් 89 වර්ෂයේදී මහින්ද රාපපක්ෂ මැතිතුමා හා වාසුදේව නානායක්කා මැතිතුමා රටේ ගැටළු ජාත්‍යන්තරට පිනීවා වලට ගෙන යාමට මුල් වූ බව ප්‍රකාශ කරන ලදි. එබැවින් රටේ කිසිදු පුරවැසියෙකු යුධ අධිකරණයට ගෙන යා නොහැකි බවත් 2001 දී විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගත් තීරණය නිසා ජාත්‍යන්තරයට ලංකාවේ ප්‍රශ්න වෙනුවෙන් මැදිහත් විය නොහැකි බවත්, ඉහත යෝජනාව රජය පැත්තෙන් අවශ්‍ය වූවක් වුවත්, ලංකාවාසීන් ලෙස ඒ සඳහා සහයෝගය පළකළ නොහැකි බවත් දන්වා සිටින ලදි.*

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

*ඉහතින් ගෙනෙන ලද යෝජනාවට සහයෝගය පළ කරන බවද, අමානුෂික අන්දමින් තරුණයක් ඝාතනය කළ නිසා එයට විරුද්ධව අතිගරු ජනාධිපතිතුමාට පිනීවා කොමිසමට යාමට සිදුවූ බවත්, නමුත් පිනීවා සමුළුව අද යුද්ධයෙන් ලංකාව නිදහස් කරගැනීමට විරුද්ධව චෝදනා ගෙන එන බවත්, ලංකාවේ උතුරේ පසුගිය කාලයේ යුද්ධයක් නොව මානුෂික මෙහෙයුමක් සිදු කල බව ද, රට බේරාගත් රට සංවර්ධනය කළ ගරු ජනාධිපතිතුමාට සහය පළ කරන ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙන අවස්ථාවේ එයට විරුද්ධව කටයුතු නොකරන බවද නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.*

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

*වසර 30ක් රටපුරා යුද්ධයක් පැවති බවද, 1991 සමයේ දැඩි භීෂණයක් පැවති අතර එයට විසඳුම් ලබාගැනීමට අතිගරු ජනාධිපතිතුමාට පිනීවා සමුළුව ඉදිරියට යාමට සිදුවූබවද, අද තත්ත්වය එයට වඩා හාත්පසින්ම වෙනස් බවද, රජයට ගෙන ආ යෝජනාවක් වුවත් එම පිනීවා යෝජනාවට විරුද්ධ වීමට උපසභාපතිතුමා ගෙන ආ යෝජනාව නගර සභාවක් ලෙස ස්ථිර කරන බවද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.*

මෙම යෝජනාවට පක්‍ෂව හා විපක්‍ෂව මත පළ වූ බැවින් ඒ සඳහා ඡන්ද විමසීමක් පැවැත්වන ලදි. එහිදී විපක්‍ෂ මන්ත්‍රීවරු තිදෙනා ඡන්දය දීමෙන් වැලකී සිටි අතර ආණ්ඩු පක්‍ෂ මන්ත්‍රීවරුන් සියළුදෙන එයට පක්‍ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි. බහුතර ඡන්දයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

මෙවර කාරක සභා නොපැවති බැවින් වාර්තා මහා සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2014 ජූනි මාසය සඳහා වන ලැබීම් හාගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 5,696,839.65 |
| වෙනත් ලැබීම් | 813,436.60 |
| **මුළු ලැබීම්** | **6,510,276.25** |
| පුනරාවර්තන වියදම් | 6,249,143.30 |
| වෙනත් වියදම් | 1,320,544.80 |
| **මුළු වියදම්** | **7,569,688.10** |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඒ සඳහා ඉදිරිපත් නොවුණි.

**13:02 2014.05.01 සිට 2014.05.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.05.01 සිට 2014.05.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 372,097.00 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

### 14:01 නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා

බළන්ගොඩ නගර සභා සීමාව තුළ වරිපනම් බදු අය කිරීම නගර සභාවෙන් සිදුවන නමුත් එම ප්‍රදේශයේ යම් යම් නිවාස වල සහෝදර ජනතාව ඡන්දය ප්‍රකාශ කිරීම හා ඔවුන්ගේ ගැටළු සඳහා පිළියම් ලබා දීමට සිදු වන්නේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව තුළිනුයි. මේ නිසා ඡන්දය ලබා දීමේදී ඔවුන් දැඩි අපහසුතාවයට පත්ව ඇති බවත්, මේ සඳහා පිළියමක් ලබාදිය යුතු බවත් නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමාන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම එම ප්‍රදේශ වල ජනතාවගේ ඉවතලන කුණු ලබා ගන්නා නමුත්, මාර්ග ප්‍රතිසංස්කරණය ආදී කටයුතු සිදු නොවන බවද 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මෙවර එම ප්‍රදේශයේ මාර්ග අළුත්වැඩියාව සඳහා තමන්ගේ ප්‍රතිපාදන වෙන්කළ බවද එතුමන් විසින් පෙන්වා දෙන ලදි.

### 14:02 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා

නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමන් විසින් ප්‍රකාශ කළ ඉහත අදහස පිළිබඳව අදහස් දක්වමින් කිරිදිගල වසමේ නගර සභාව තුළින් වරිපනම් එකතු කර ගැනීම පමණක් සිදු නොකරන අතර, ඔවුන්ට අවශ්‍ය පහසුකම් වන ඉවතලන අපද්‍රව්‍ය එකතු කිරීම, අවශ්‍ය අවස්ථාවල ජල පහසුකම් ලබා දීම, පාරවල් සැකසීම හා කාණු ප්‍රතිසංස්කරණය වැනි බොහෝ දේ ප්‍රාදේශීය සභාවෙන් නොව නගර සභාවෙන් සිදු කරන බවද, ඡන්දය ලබාදීම පමණක් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත සිදුවන නමුත් සියළු පහසුකම් නගර සභාවෙන් ඉටු කරන බවද නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.

### 14:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

සාමාන්‍ය මනුෂ්‍යයන් ලෙස මේ සභාව තුළ විනෝදයෙන් කටයුතු කළත් ගන්නා තීන්දු තීරණ වල වගකීමක් ඇති බවද, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් මෙන් නොව තමන්ගේ හැසිරීම මේ කුඩා සභාව තුළ ආදර්ශමත් බවද, වගකීම් යුතුකම් නිසිලෙස ඉෂ්ඨ කරමින්, ජනතාව තමන් මන්ත්‍රීවරුන් ලෙස සභාවට පත් කර ඇති අරමුණ ඉටුකල යුතු බවද ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් පෙන්වා දෙන ලදි. එසේම 1977 සිට ලංකාවේ ඇති ආසන 167 න් පාර්ලිමේන්තු නියෝජනයක් නොමැති එකම ආසනය ලෙස බළන්ගොඩ ආසනය වසර 36 ක කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොමැති වුවත් නගර සභාව හා ප්‍රාදේශීය සභා දෙක එම අඩුව නොපෙනෙන සේ ප්‍රදේශයේ සංවර්ධනයට උර දී ඇති බවත්, ඒ සඳහා ඇපකැප වූ ගරු සභාපතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට ස්තුතිය පළ කළ යුතු බවත්, එසේම පළාත් තරග වලට මෙන්ම ජාතික මට්ටමේ කාර්යසාධන, ඵලදායිතා තරග සඳහා යොමුවුවත් සියළු ආයතන අභිබවා බළන්ගොඩ නගර සභාව ඉදිරියට ගමන් කළ හැකි තත්ත්වයටක පත්කර ඇති බවද, ඒ සඳහා මන්ත්‍රීවරුන් ලෙස තමන්ද නිලධාරීන්ද ඉමහත් කැපකිරීමක් කර ඇති බවද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

තමන්ගේ වගකීම ඉටු කිරීම නිසා මෙලෙස කීර්ති නාමයෙන් පිදුම් ලැබීමට හැකියාව ලැබී ඇති බවද ලංකාවේ සියළු දිශාවන්හි බළන්ගොඩ නගර සභාව හා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ප්‍රචලිත වී ඇති බවද, එම නිසා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඇති අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කළ යුතු බවද, කිසිවෙක් හෝ තනතුරෙන් ඉවත් නොකළ යුතු අතර ව්‍යාපෘති අතරමග නතර නොකර පෙර ක්‍රියාත්මක කළ ආකාරයට මතුව ඇති ගැටළු සඳහා පිළියම් සිදු කරමින් යහපත් ගමනක් යායුතු බවද ගරු උපසභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම ජිනීවා සමළුවේ දී ගෙන ඇති යෝජනා සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් විරුද්ධත්වය ප්‍රකාශ කිරීම හා මානව හිමිකම් හා යුධ අපරාධ පිළිබඳ සෙවීමට ලංකාවට ඒමට විරුද්ධත්වය ගරු සභාව තුළ යෝජනා ස්ථිර කර ගැනීම සඳහා තමන් යෝජනාව ගෙන ඒමට හේතුව කුඩා සභාවක් ලෙස විශාල බලපෑමක් සිදුකළ නොහැකි නමුත් අනෙක් සභාවන් සඳහා ආදර්ශයක් ලබාදීම බවත්, රු. 250,000 බැගින් වූ මන්ත්‍රී ප්‍රතිපාදන විපක්‍ෂ මන්ත්‍රීවරුන් සඳහා ලබාගත හැකිවූයේ ද ඉන්ධන දීමනා ලබා දෙන්නේ ද තමන්ගේ හා ධර්මසේන සමරසිංහ මැතිතුමාගේ මැදිහත්වීමෙන් බවත් පෙන්වා දුන් ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් තමන්ගේ යෝජනාවට ඡන්දය ලබාදීම ප්‍රශ්නයක් නොවන නමුත් රටේ දැන් පවතින තත්ත්වය අනුව මෙම යෝජනාව සම්මත කර ගැනීම කළ යුතුම දෙයක් බව ද ඒ සඳහා ඡන්දය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ට කෘතඥතාවය පළ කරන බවද ප්‍රකාශ කරන ලදි.

එසේම කොම්පොස්ට් ව්‍යාපෘතිය භාර ගැනීම සඳහා සභාපතිතුමා විසින් ඉල්ලීමක් කළද එය භාර ගැනීම හා පිළිගැනීමක් නොකරන අතර එම ව්‍යාපෘතිය සඳහා සියළු සහයෝගය ලබා දෙන බවද පෙර පැවති කොම්පොස්ට් ව්‍යාපෘතිය නැවත එම තත්ත්වයට ගෙන ඒමට මෙන්ම පවරන ලද සියළුම රාජකාරී පෙර පරිදි නොපිරිහෙලා ඉටු කිරීමට බැඳී සිටින බවද ප්‍රකාශ කළ ගරු උපසභාපතිතුමා බළන්ගොඩ වෙළඳ සංගමය විසින් ලිපියක් යොමු කරමින් ත්‍රීවිල් රථ නැවැත්වීම සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ගය විමසුවත්, ගරු සභාපතිතුමන් නියම කරන ලෙස සියළු කටයුතු ඉටු කරනු ලැබූවත් එම ගැටළුවට මෙතෙක් විසඳුම් නොලැබී ඇති බැවින් එම කරුණු පිළිබඳ නැවත සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

**14:04 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

තුඹගොඩ ප්‍රදේශයේ ඇති No parking නාම පුවරුව ගැලවීමට පසුගිය අප්‍රේල් මාසයේ සභාවේදී තීරණය කරනු ලැබූවත් මේ වනතෙක් එය ක්‍රියාත්මක කර නොමැති බවද එය ක්‍රියාත්මක කරන ලෙසද, එතැන ඇති කහඉර ඉවත්කරන ලෙස ද පොලීසිය දැනුවත් කරන ලෙස නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි.

එසේම PS Tyre Works අයිතිකරුගේ නිවසට යන මාර්ගය ශුද්ධ කර අළුත්වැඩියා කර දෙන ලෙසද එසේම එම මාර්ගයේ ඇති කාණුව සම්බන්ධව ගැටළුවක් මතුවී ඇති බවත් එය කඩිනමින් විසඳාගැනීමට කටයුතු කළ යුතු බවත් කර්මාන්ත කමිටුමේ ගරු සභාපතිතුමාට පූර්ණ බලතල පැවරුණ බැවින් ඒ පිළිබඳ අවධානය යොමුකරන ලෙසත් ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

ත්‍රීවිල් රථ ජීවන වෘත්තියක් බැවින් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීමේදී මංතීරු 04 විසඳුමට හෝ මගී පදික වේදිකාව නිසි ලෙස සකසා ගැනීමේ ක්‍රමවේදයක් සකසා ගත යුතු බවත් වෙළඳ සංගමය හා සාකච්ඡා කර නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් පරිදි හැකි ඉක්මනින් පියවරක් ගත යුතු බවත් එතුමන් විසින් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්‍ෂ මැතිතුමා**

ෆලීල් හජ්ජියාර් මාවත සකස් කර දෙන ලෙස කර්මාන්ත කමිටුවේ ගරු සභාපතිතුමන් ගෙන් ඉල්ලා සිටින ලදි. එසේම උප සභාපතිතුමන් විසින් ගෙන එන ලද ජිනීවා සමළුවේ දී ගෙන ඇති යෝජනා සඳහා විරුද්ධත්වය පළ කිරීම අවශ්‍ය නොවන බවද එය රජය විසින් මවා ගත් ගැටළුවක් බවද රජය විසින් ප්‍රකාශ කරන ලද දේ නොකිරීම නිසා පුද්ගලයන් මානව හිමිකම් වෙනුවෙන් පැමිණිලි කළ බවද, යුද්ධයෙන් පසුව දියයුතු වූ සහන ලබා දුන්නානම් ගැටළු පැන නොනගින බව ද එතුමන් විසින් පෙන්වා දෙන ලදි. එසේම

ස්වාධීන පොලිස් කොමිසමක් හා ස්වාධීන මැතිවරණ කොමිසමක් පත් කළහොත් ආණ්ඩුවට සහයෝගය ලබා දෙන බවද සාධාරණ මැතිවරණයක් නම් මුළු දිවයිනෙහිම එක් දිනයකදී පැවැත්විය යුතු වුවත් එය වෙන් වෙන් වශයෙන් පැවැත්වීම නිසා මැතිවරණ දූෂණ, වංචා සිදුවන බවද, ස්වාධීනව කටයුතු කිරීමට පොලිසියට නොහැකිවී ඔවුන් අසරණ වී ඇති බව ද නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම අළුත්ගම දර්ගා නගරයේ සිදුවීමට කණගාටුව පළ කරන බවද සියළුම ජනතාව සහයෝගයෙන් කටයුතු කළ යුතු බවද මුස්ලිම් ජනතාව අන්තවාදී නොවන බවද මුස්ලිම් නමින් පක්ෂයක් අවශ්‍ය නොවන බව හා මුස්ලිම් අන්තවාදීන්ට තමන් විරුද්ධ වන බවද සියළුම ජනවර්ගයා සමග සමගියෙන් කටයුතු කරන බවද ප්‍රකාශ කරන ලදි.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

උපසභාපතිතුමන් ප්‍රකාශ කළ ආකාරයට විපක්ෂ මන්ත්‍රීවරුන්ට රු. 250,000 මුදල හා ඉන්ධන දීමනාව ලබා දීමට මූල් වූයේ තම පක්ෂයේ මන්ත්‍රීවරුන් බවත් තමන් සැම විටම රට වෙනුවෙන් පක්ෂය වෙනුවෙන් කථා කරන ක්‍රියාකරන අයෙකු බවත් රටේ නායකයා වෙනුවෙන් විරුද්ධ වීම රටට විරුද්ධ වීමක් බවත්, රජයට විරුද්ධ මන්ත්‍රීවරු රජයේ ප්‍රතිලාභ ලබන නමුත් රජයට විරුද්ධව ක්‍රියා කිරීම සමස්ථ ජීවන රටාවටම බලපාන බවද නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.

එසේම ජීවත් වන රට අතහැර යාමට තැනක් නොමැති බවත්, ඉපදුන රටට වෙනත් රටකින් අපහාස කිරීමට ඉට නොදෙන බවත් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමන් විසින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරක්ෂා කරගත යුතු බවද, බළන්ගොඩ සුන්දර නගරය රැක ගනිමින් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සිදුවී ඇති දුර්වලතා මගහරවා ගැනීමට ක්‍රියාකල යුතු යැයිද ලොවෙහි කීර්ති නාමයක් ලබා ගැනීමට හැකිවූ එම ව්‍යාපෘතිය තව තවත් සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු බවද පවසන ලදි.

එසේම අන්තවාදය සඳහා තිත තැබිය යුතු බවද දර්ගා නගරයේ සිදුවීම නිසා ජාතීන් අතර අසමගිය ඇතිවීම වැළැක්විය යුතු බවද, සුළු සිදුවීම් නිසා ගැටුම් ඇතිකර නොගත යුතු බවද බළන්ගොඩ ප්‍රදේශයේ ජාතිවාදයක් නොමැති බවට අබුසාලි මැතිතුමා පාර්ලිමේන්තුවට යැවීමට හා ඇමතිවරයෙක් ලෙස ඔසවා තැබීමට සිංහල ජනතාව මුල්වීම උදාහරණයක් බවද සඳහන් කළ එතුමා සියළුම ආගමික සංස්කෘතික කටයුතු වලදී එකමුතුව කටයුතු කරන බව හා මින් පසු දර්ගා නගරයේ සිදුවීම වැනි දේ සිදු නොවන ලෙස කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේ ය. එතුලින් ජාත්‍යන්තරය තුළ ලංකාව පිළිබඳ වැරදි ආකල්පයක් ඇති නොකරන ලෙස ද වැඩි දුරටත් ඉල්ලා සිටින ලදි.

**14:06 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගේ සහයෝගයෙන් මන්ත්‍රී ප්‍රතිපාදන විපක්ෂයට ලැබුණ බවද ඊට ස්තුතිය පළ කරන බවද, නමුත් පක්ෂයක් ලෙස තීන්දු තීරණ ගැනීමේ දී නායකත්වයට අවනත විය යුතු බවත්, පක්ෂයේ මතයට ගරු කර එය ප්‍රකාශ කරන බවත් නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම රටක පක්ෂ කීපයක් තිබීම තුළ සියළු මත ඉවසීමේ හැකියාව තමන් සතු විය යුතු බවත් ජිනීවා යෝජනාවට ඡන්දය නොදීම තුළ විවිධ චෝදනා එල්ලවීම සම්බන්ධයෙන් කණගාටුව පළ කරන බවත් දැන්වූ එතුමා ගරු සභාව මේ වන විට ඉතා සාමකාමීව ගලා යන බව ද එයට සතුටුවන බවද දර්ගා නගරයේ සිදුවීමට කණගාටුව පළ කරන අතර

සියළුම ජනතාව එක්ව කටයුතු කරන බවද නමුත් රටේ ජනතාව ලෙස විදේශයෙන් එන සියළුම දෝෂාරෝපන සඳහා එකඟ නොවන බව ද දන්වන ලදි.

එසේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් ලෙස තමන්ට හා අසංක නිල්මිණි විජේසිංහ මහතාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් ප්‍රතිපාදන නොලැබී ඇති බවද, නමුත් ගරු සභාපතිතුමන්ගේ මැදිහත්වීමෙන් අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ සහයෝගයෙන් ලබා දුන් ප්‍රතිපාදන සඳහා කෘතඥතාවය පළ කරන බවද ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම විපීපහන් කටයුතු පිළිබඳ සැලකිල්ල දක්වන ලෙස එතුමන් විසින් ඉල්ලා සිටින ලද අතර ලෝකයේ ඉතාම මිත්‍රශීලී ජනයා ලංකාවේ ජනතාව බව අවසාන වශයෙන් එතුමන් විසින් සඳහන් කරන ලදි.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා සඳහන් කළ යම් යම් ප්‍රදේශවල ජනතාව නගර සභාවට වරිපනම් බදු ගෙවීම හා ඡන්දය බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට ලබා දීමට හේතුව වී ඇත්තේ මාර්ග නිසි පරිදි නිර්ණය නොවීම බව ද ඉදිරි මැතිවරණයට පෙර මෙම ගැටළුව විසඳා ගැනීමට හැකිවනු ඇතැයි ද ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

එසේම හැකි ඉක්මනින් දිනයක් යොදා ප්‍රදේශයේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ අධීක්ෂණයක් කරන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ට දන්වන ලද අතර පසුව ප්‍රමුඛතා ලේඛනයක් සකසා එම මාර්ග නඩත්තු කිරීමට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදි.

මේ සියලුම දේවල් තුළින් ප්‍රදේශයේ බදු ගෙවන ජනතාව වෙත යහපත් සේවාවක් සැලසීම සඳහා කටයුතු කරන බවද ප්‍රකාශ කරමින් රටේ නායකයා ලෙස හා යුද්ධය නිමා කළ අතිගරු ජනාධිපතිතුමන්ගේ ඉදිරි ගමන සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවද, ජාති ආගම් භේදයක් නොමැතිව සහයෝගයෙන් කටයුතු කිරීමට කැපවිය යුතු බව ද දන්වමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 2.00ට අවසන් කරන ලදී

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.